ජාතික දේශපාලන නායකයිනි,

වතුකරයේ දේශපාලන හා වෘත්තීය සමිති නායකයිනි,

**<u>වතු ආශ්‍රිත පළාත් පාලන ආයතන සඳහා අපේක්ෂකයින් තේරීමේදී අපේක්ෂක සංඛ්‍යාවෙන් 40%ක් වතු කාන්තාවන් සඳහා වෙන් කිරීම</u>**

- ළඟ එන පළාත් පාලන මැතිවරණයේදී වතු ආශ්‍රිත පළාත් පාලන ආයතන සඳහා වතු කාන්තා අපේක්ෂක නියෝජනය 40% පදනම තහවුරු කරමු.
- ලෝකයේ පළමු කාන්තා අගමැතිනිය බිහිකළ රට අපේ රටයි.
- ලෝකයේ පළමු කාන්තා විධායක ජනාධිපතිවරිය හඳුන්වා දුන්නේ ද ශ්‍රී ලංකාවෙනි.
- 1930 දී කාන්තා පිරිමි දෙපක්ෂයටම සර්වජන ඡන්ද අයිතිය ලබා දීමෙන් ශ්‍රී ලංකාව තුළ දේශපාලනයේදී කාන්තාවට සම තැන හිමි විය යුතු බව ආදර්ශයෙන් පෙන්නුම්කර ඇත.
- මෙවන් ආදර්ශ ඇති රටක වතුකරයේ කාන්තාවගේ තත්ත්වය කෙබඳුද ?
- පාර්ලිමේන්තුව තුල වතුකරයේ කාන්තා නියෝජනයක් ඇත්තේම නැත. පළාත් සභා තුළ වතුකරයේ කාන්තා නියෝජනය එක් නියෝජිතවරියකට සීමා වී ඇත. ප්‍රාදේශීය සභා තුළ කිසිදු නියෝජනයක් වතුකරයේ කාන්තාව සඳහා හිමි වී නැත.
- මේ තත්ත්වය අප වෙනස් කළ යුතු නොවේද?
- වතුකරයේ කාන්තාවන් දේශපාලන කරලියට පිවිසීම සඳහා අවස්ථාව සලසාදීම ඔබේ යුතුකම නොවන්නේ ද?

- වතුකරයේ කාන්තාවන්ද දේශපාලන නියෝජිතවරියන් ලෙස පත්වී අපේ රටේ දේශපාලන අධිකාරියේ කොටස්කාරියන් විය යුතු නේද?
- එනම් ළඟ එන පළාත් පාලන ඡන්දයේදී වතුකරයේ කාන්තා නියෝජනය සහතික කිරීම තුළින් වතු කාන්තාවන්ගේ දේශපාලන අයිතිය තහවුරු කරමු.

සමාජ සංවර්ධන ආයතනය වැඩකරන කාන්තා පෙරමුණ

වතුකරයේ සමාජ සංසදය

**37**, බෝධියංගන මාවත, මහනුවර. ටෙලි/ෆැක්ස්. **081-2202923**
ඊමේල් - kandyisd@sltnet.lk or march wwf@gmail, com and pssfsl@ hotmail.com.